අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ - 02/2023(ii)

මගේ අංකය : MOJ/E9/පි.ගා.ස./2021

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම
ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
කොළඹ 10
2024.06. 11

සියලුම මහාධිකරණ විනිසුරුවරුන්,
සියලුම දිසා විනිසුරුවරුන්,
සියලුම මහේස්ත්‍රාත්වරුන්,
සියලුම කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන්,
රෙජිස්ට්‍රාර්, ශ්‍රේෂ්ඨාධිකරණය,
රෙජිස්ට්‍රාර්, අභියාචනාධිකරණය,

<u>අධිකරණ හා කම්කරු විනිශ්චය සභා මඟින් නිකුත් කරනු ලබන පිටපත් ගාස්තු සහ සහතික කරන ලද ඡායා පිටපත් නිකුත් කිරීමේ ගාස්තු</u>

උක්ත මැයෙන් යුතුව නිකුත් කරන ලද 2023.07.10 දිනැති අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ 02/2023 හා 2023.09.12 දිනැති අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ 02/2023(i) මෙයින් අවලංගු කරනු ලැබේ.

02. ඒ අනුව, 2024.06.11 දින සිට අධිකරණ හා කම්කරු විනිශ්චය සභා මඟින් සහතික කරන ලද ඡායා පිටපත් නිකුත් කිරීමේදී හා ඒ සඳහා ගාස්තු අය කිරීමේදී පෙර පැවති 2006.06.01 දිනැති අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ 06/2006 හා 1997.10.06 දිනැති අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ 13/97 හි විධිවිධාන අදාළ කර ගන්නා ලෙස දැනුම් දෙනු ලැබේ.

03. සහතික පිටපත් හා සහතික කරන ලද ඡායා පිටපත් නිකුත් කිරීමේ ක්‍රියාවලියට අදාළ ලිපි ද්‍රව්‍ය සඳහා **අමතර ප්‍රතිපාදන ලබා දීමක් සිදු නොකරන අතර පවතින ප්‍රතිපාදන සීමාව තුළ වියදම් කළමනාකරණය කරගත යුතු බව වැඩිදුරටත් අවධාරණය කරමි.**

**එම්.එන්.රණසිංහ**
ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

පිටපත් :

1. ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව
2. ප්‍රධාන මූල්‍ය නිලධාරී, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය